# සීතාවක රාජසිංහයන් හා සබැඳි දේවෝත්පත්ති කතාව හෙවත් ගනේගොඩ දේවතා සංකල්පය

එම්. බී. බුද්ධික ජයසුන්දර

The tales related to the origin of the ethereal phenomena is a one important aspect of folklore. Most of these stories expouh the elevation of a famous person in society in to goddom, through his potent abilities and persona. According to the religious concepts and the accepted social belief, person engaged in meritious deeds as a consequence, posthumously will be born as a God; a sublime being. However some mortals were turned in to gods not because of the good qualities they have processed or displayed, during their life span but because of their very промfociousness. The god Ganegoda who is popular in the regions of Seethawaka and Mirigama could be considered as a god who demonstrate the latter quality. According to folktales God ganegoda is the re-birth of Rajasingha the 1st who was the greatest ruler of the kingdom of Sithavake Rajasingha the 1st who's a war-hero and who massacred thousands of Portuguese was fondly remembered by people as a ruler who fought vehemently for the sovereignty of the motherland. Yet he has a low estimation as a power thirsty son who committed patricide. Further it is well known fact that he had engaged in sacrilege and at a later age he had converted in to saivasim. The historical facts and existing folklore prove that Rajasingha the 1st was elevated in to Goddom mainly because of his warrior skills.Also the general public fear and

© කථිකාචාර්ය එම්. බී. බුද්ධික ජයසුන්දර
සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 22 කලාපය, 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය



thus honored him.This study aims to examine the concept of god Ganegoda by analyzing the historical as well as the folkloric sources and the data collected during the field explorations.

## ප්‍රවේශය

දේවෝත්පත්ති කතා යනු ජනශ්‍රැති මූලාශ්‍රයක් වන ජන කතාවට අයත් එක් ප්‍රභේදයකි. ලංකාවේ ප්‍රාදේශීයව පිදුම් ලබන දෙවිවරුන් හා සබැඳි බොහෝ උත්පත්ති කතාවලින් කියැවෙනුයේ ජන සමාජයෙහි ප්‍රසිද්ධියට පත් පුද්ගලයකු ඔහු සතු සුවිශේෂ හැකියාවක් හෝ ගුණාංගයක් හෝ නිසා මරණින් මතු දෙවියකු බවට පත් වූ ආකාරයයි. ආගමික සංකල්පයන්ට හා සමාජ සම්මතයන්ට අනුව දෙවියකු යනු උත්තරීතර පුද්ගලයෙකි. එබඳු තත්ත්වයකට පත්වීමට නම් යහපත් (කුසල) ක්‍රියාවන්හි නිරත විය යුතු ය. නමුත් ඇතැම් දේවෝත්පත්ති කතාවලින් කියැවෙන ආකාරයට ඇතැමෙක් මරණින් මතු දෙවිවරුන් බවට පත්ව ඇත්තේ තමා ජීවත් වූ සමාජය කම්පනය කිරීමට සමත් බිහිසුණු ක්‍රියාවලියකට සම්බන්ධ වීම නිසා ය. සීතාවක හා මීරිගම ප්‍රදේශවල ප්‍රචලිතව පිදුම් ලබන ගනේගොඩ දේවතාවා ද ඉහත සඳහන් ගණයට අයත් දෙවියකු ලෙස සැලකිය හැකි ය ජනප්‍රවාදයන්ට අනුව ගනේගොඩ දෙවියන් ලෙස උපත ලබා ඇත්තේ සීතාවක රාජධානියේ අසහාය පාලකයාව සිටි I රාජසිංහ (ක්‍රි. ව. 1581-1591) රජතුමා ය. මරණින් මතු ගනේගොඩ දෙවියන් ලෙස උපත ලද හෙතෙම ජනතාවට සෙත සලසමින් ඔවුන් ආරක්ෂා කරන බව ප්‍රදේශවාසීහු විශ්වාස කරති. **කබුලුමුල්ල පත්තිනි දේවාලය, මැදගොඩ පත්තිනි දේවාලය, මීරිගම බොකලගම ගනේගොඩ දේවාලය** යන ස්ථානයන්හි ගනේගොඩ දේවතාවා පිදුම් ලබයි.

පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළ යුද වීරයෙකු හා සීතාවක රාජධානිය උච්චස්ථානයට නැංවීමෙහිලා ක්‍රියා කළ අසහාය පාලකයකු ලෙස කීර්තියට පත් වුවත් පීතෘ ඝාතකයකු වීම, සංඝ ශාසනය හා බෞද්ධ දේපළ විනාශ කිරීම, ශිව දහම වැලඳ ගැනීම යන චෝදනා මත I රාජසිංහයන් සමාජ අපවාදයට ලක්ව තිබේ. ඇතැම් ඓතිහාසික මූලාශ්‍රය හා විදේශීය වාර්තා උක්ත

චෝදනාවන්ගෙන් රාජසිංහයන් නිදොස් කොට නිවැරදි කළ ද ජනප්‍රවාදයන්ට අනුව ඔහු වරදකරුවෙකි. රාජසිංහයන්ගේ දේවෝත්පත්තිය තහවුරු කෙරෙන **දේවාල උපත** නමැති ඓතිහාසික ලියවිල්ලත්, **ගනේගොඩ යාදින්න** සහ **ගනේගොඩ දෙවියන්ගේ කීම** නම් වූ දේව සැහැලිත් ජනප්‍රවාදයෙහි පවත්නා විශ්වාස හා සමපාත වෙයි. ඒවායෙහි අන්තර්ගත තොරතුරුවලින් තහවුරු වන ආකාරයට I රාජසිංහයන් මරණින් මතු දෙවියකු බවට පත්ව ඇත්තේ යුද වීරත්වය හා ඔහු කෙරෙහි මිනිසුන් තුළ වූ බය පක්ෂපාතීත්වය නිසා ය. ඉහත සඳහන් කරන ලද ඓතිහාසික හා ජනශ්‍රැති මූලාශ්‍රය ද ක්ෂේත්‍ර ගවේෂණයෙන් ලද තොරතුරු ද ආශ්‍රය කර ගනිමින් සීතාවක රාජසිංහයන් හා සබැඳි දේවෝත්පත්ති කතාව හෙවත් ගනේගොඩ දේවතා සංකල්පය පිළිබඳ විමර්ශනයක යෙදීම මෙම අධ්‍යයනයේ පරමාර්ථයයි.

## දේවෝත්පත්ති කතා

දෙවිවරුන්ගේ උත්පත්තිය පිළිබඳ තොරතුරු සඳහන් වන මිත කතා (Myth) ගණයෙහිලා සැලකිය හැකි දේවෝත්පත්ති කතා ජනශ්‍රැති මූලාශ්‍රයක් වන ජන කතාවට අයත් එක් ප්‍රභේදයකි. සිංහල බෞද්ධ සමාජයෙහි ප්‍රචලිතව පවත්නා විවිධ දේව විශ්වාස හා බැඳුණු උත්පත්ති කතා ඇසුරින් ඒ ඒ දෙවිවරුන්ගේ ප්‍රභවය පිළිබඳ පර්යේෂණයන්හි නිරත වුණු වියත්හු සිංහල බුදු සමයෙහි පිදුම් ලබන දෙවිවරු පංචවිධ ප්‍රභේදයන්ට බෙදා දක්වති.

(අ) භාරතීය හින්දු සම්ප්‍රදායෙන් පැමිණි අයඃ එනම් **විෂ්ණු, ස්කන්ධ, පත්තිනි, ගණේෂ** ආදීහු.

(ආ) ප්‍රාග් ඓතිහාසික අවධියෙහි සිදු වූ ස්වදේශීය ජන්මයක් ඇති දෙවිවරුඃ එනම් **විභීෂණ, සමන්, උපුල්වන්, දැඩිමුණ්ඩ** ආදීහු.

(ඇ) ඓතිහාසික යුගයේ දී දේවත්වයට නංවනු ලැබූ වීර පුරුෂයෝඃ එනම් **මින්නේරි දෙවියෝ, කීර්ති බණ්ඩාර, නිරාමුල්ලේ යාපා බණ්ඩාර, කිවුලේගෙදර බණ්ඩාර** ආදීහු.

(ඈ) දේවත්වයට පත් වූ සංක්‍රමණිකයෝඃ එනම් **පිටියේ දෙවි, දෙවොල් දෙවි, පනම් බණ්ඩාර** ආදීහු.

(ඈ) බුදුසමය තුළින් දේවත්වයට පත් වූ අයඃ **නාථ දෙවි**[1]



මේ වර්ග කිරීමට අනුව ඓතිහාසික යුගයේ දී දේවත්වයට නංවනු ලැබූ වීර පුරුෂයෝ ද, දේවත්වයට පත් වූ සංක්‍රමණිකයෝ ද ලංකාවේ ප්‍රාදේශීයව පිදුම් ලබන දේව ගණයට ඇතුළත් වෙති. ඔවුන් හා සබැඳි බොහෝ උත්පත්ති කතාවලින් කියැවෙනුයේ ජන සමාජයෙහි ප්‍රසිද්ධියට පත් පුද්ගලයකු ඔහු සතු සුවිශේෂ හැකියාවක් හෝ ගුණාංගයක් හෝ නිසා මරණින් මතු දේවත්වයට පත් වූ ආකාරයයි. ප්‍රාදේශීයව අණසක පතුරවන මේ දෙවිවරු බොහෝ දෙනා මිනිසකුව ජීවත්ව සිටි කාලයේ ඒ ඒ ප්‍රදේශවල ජනතාවට විවිධාකාරයෙන් සේවය සැපයූ ප්‍රකට පුද්ගලයෝ වෙති. උදාහරණ වශයෙන් කෑගල්ල අවිස්සාවේල්ල, හංවැල්ල, කිරිදිවැල ආදී කැලණිගං සීමාවේ ගම් ප්‍රදේශවල පිදුම් ලබන රන්වල දෙවියන් සඳහන් කළ හැකි ය. ඔහු මිනිසෙකුව ජීවත්ව සිටිය දී නැති වූ දේ සොයා ගැනීමට මිනිසුන්ට උදව් වූවේ ය. හෙතෙම පහුරක නැගී සෑම පෝ දිනකම කැලණි වන්දනාවේ ගියේ ය. ඔහුගේ ගමන පහසු කරන්නට ගං දැළෙහි ජනතාව ගඟදිගට පුහුල් එල්ලූහ. මරණින් මතු රන්වල දෙවියන් ලෙස උපත ලද ඔහුගෙන් ඒ ඒ ප්‍රදේශවල ජනතාව පිහිට අපේක්ෂා කරන්නේ පුහුල් පහන් දල්වා ඔහුව ස්මරණය කිරීමෙනි.[2] බෞද්ධයන් විශ්වාස කරන ආකාරයට කර්මඵලය හා පුනර්භව සංකල්පයන්ට අනුව කිසියම් පුද්ගලයකු මරණින් මතු දේවාත්මභවයක පුනර්ජන්මය ලැබිය හැකි ය. විශේෂයෙන් සිය ජීවිත කාලය තුළ යහපත් ක්‍රියාවන්හි යෙදුණකු එම කුසල කර්මයන්හි පලවිපාක වශයෙන් මරණින් පසු දෙවි කෙනෙකු බවට පත්වීම බෞද්ධ විශ්වාසයන්ට අනුව පිළිගත හැක්කකි.[3] නමුත් ඉහත සඳහන් කළ ප්‍රාදේශීය දෙවිවරුන් අතුරින් ඇතැමෙක් දේවත්වයට පත්ව ඇත්තේ මනුෂ්‍යයන්ව සිටි කාලයේ ඇතැම් අයහපත්, බිහිසුණු ක්‍රියාවලියකට දායක වීම නිසා බව ඒ ඒ දෙවිවරුන් සම්බන්ධ උපත් කතාවලින් පැහැදිලි වේ. **අබූත දෙවි** ලෙස උපන්නේ ගජබා රජු විසින් වාහල්කඩ දොරටුපාල තනතුරට පත් කරන ලද්දෙකි. මේ දොරටුපාලයා රජුට විරුද්ධව කුමන්ත්‍රණය කළ හෙයින් ගම්පිහිල්ලෙහි දී මරණයට පත් කරන ලදී. ඔහුගේ අවතාරය දුන්නගම, අයගම, හුන්නස්ගිරිය ආදී පෙදෙස්හි සැරිසරමින් **''අබූත දෙවි'' ''ඔය දෙවි''** යන නමින් පුද සත්කාර ලබයි. **අඹන්වෙල දෙවියන්** ලෙස උපත ලද්දේ දෙවන රාජසිංහ රජුට විරුද්ධව කැරැල්ලක් මෙහෙයවා හිස් ගැසුම් කෑ අඹන්වෙල රාළ ය. **උඩුගම්පොළ කළුකුමාර** දෙවියන්ව උපත ලබා ඇත්තේ තම පියා මැරීමට දියේ උල් සිටුවීමේ

පාප කර්මය නිසා මැරුම් කෑ රාජ කුමාරයෙකි. **පිටියේ දෙවියන්** ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ තම රියෙහි සකට යට කොට වසු පැටවකු මැරීමේ වරදට මැරුම් කෑ සොළී කුමාරයෙකි. තම කුරිරුකම් නිසා ගම් නියම්ගම්වල භීෂණය පැතිර වූ දෙවි කෙනෙකු ලෙස **පනම් බණ්ඩාර** ප්‍රසිද්ධ ය.[4] මින් පැහැදිලි වන්නේ තමන් ජීවත් වූ සමාජය කම්පනය කිරීමට සමත් වූ යහපත් හෝ අයහපත් කාරණයකට මුල් වීම දේවත්වයට පත් වීමට සුදුසුකමක් වූ බවයි. මේ අනුව සීතාවක රාජසිංහ රජු ගනේගොඩ දේවතාවා ලෙස දේවෝත්පත්තියක් ලබන්නේ කවර සාධක මත ද යන්න විමසා බැලිය යුතු ය.

## සීතාවක රාජසිංහ රජතුමා

කටේ කිරි සුවඳ මැකෙන්නටත් පෙර සංග්‍රාමයට වන් යුද වීරයෙකු ලෙස සැලැකෙන ටිකිරි රජ්ජුරු බණ්ඩාර[5] හෙවත් I රාජසිංහ (1580-1588), සීතාවක රාජධානියේ නිර්මාතෘ වූ මායාදුන්නේ රජුගේ (1521-1580) පුත්‍රයා ය. 1521 වන විට ඉතා කුඩා පාලන ප්‍රදේශයක්ව පැවැති සීතාවක ප්‍රබල රාජධානියක් බවට පත් කිරීමට උර දුන් හෙතෙම ඒ සඳහා පළමු පියවර තබන්නේ 1565 දී කෝට්ටේ රාජධානිය සීතාවකට ඈඳා ගැනීමෙනි. පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළ යුද වීරයකු වශයෙන් I රාජසිංහයන් ඉතිහාසගත වන්නේ 1583 දී පෘතුගීසීන්ට එරෙහිව කරන ලද මුල්ලේරියා සටනත් සමග ය. පෘතුගීසි සෙබළුන් 1600කට පමණ ජීවිත අහිමි කළ පැය 16ක් පුරා පැවති මේ සටන පෘතුගීසීන් පෙරදිග දී ලත් සුවිසල්ම පරාජය ලෙස ඉතිහාසගතව පවතී.[6] සීතාවක රාජධානිය ශ්‍රේෂ්ඨත්වයෙහිලා නැංවීමට ක්‍රියා කළ නර වීරයකු වුව ද I රාජසිංහ බලලෝභියෙකු පීතෘ ඝාතකයෙකු ලෙස ද ශිව ආගම වැලඳගෙන බුදු සසුන හා සංඝ සමාජය විනාශයට පත් කළ බෞද්ධ විරෝධියෙකු ලෙස ද චෝදනා ලබයි. 1580 දී සිදු වූ මායාදුන්නේගේ මරණය ස්වාභාවිකව සිදුවූවක් නොව රජකම ලබා ගැනීමේ ලෝභයෙන් රාජසිංහයන් විසින් සිදු කරන ලද මිනීමැරුමක් ලෙස අර්ථ ගන්වන චූළවංසකරුවා රාජසිංහයන් 'තමන් පියහු ද සියතින් මරා දුර්මති වූයේ රාජ්‍ය ගත්තේ යැ' යනුවෙන් චෝදනා කරයි.[7] කුතෝ පවසන පරිදි රාජසිංහයන් මායාදුන්නේ ඝාතනය කළේ මායාදුන්නේ රජුගේ මාළිගයේ වෙසෙන රාජසිංහයන්ට විශ්වාස ඒ කාර්යය කිරීමේ හැකියාව ඇති පුද්ගලයන් ලවා වස දීමෙනි.[8] නමුත් රාජාවලිය,[9] සීතාවක හටන,[10] ආදී දේශීය මූලාශ්‍රය ද ක්වේරෝෂ්ගේ වාර්තා.[11]



**The Temporal Spiritual Conquest of Ceylon, Vol. i-iii by Fernao de** ද සඳහන් කරන පරිදි මායාදුන්නේගේ මරණය ස්වාභාවිකව සිදු වූවක් වන අතර ඊට ප්‍රථම I රාජසිංහයන් බලයට පත් වී තිබේ. ඓතිහාසික මූලාශ්‍රයන්හි ඇතුළත් මෙකී පරස්පරතා අනුව පැහැදිලි වන්නේ I රාජසිංහයන්ගේ පාලනය පිළිගත් හා නොපිළිගත් කණ්ඩායම් දෙකක් එකල විසූ බවයි. විශේෂයෙන් ම සීතාවක යුගයේ ඓතිහාසික තොරතුරු වාර්තා කළ උඩරට ලේඛකයෝ රාජසිංහයන්ට පක්ෂව ද පහතරට ලේඛකයෝ රාජසිංහයන්ට විපක්ෂව ද කරුණු දක්වා ඇති බව පැහැදිලි වේ. සීතාවක රාජධානිය පිළිබඳ පැහැදිලි සාක්ෂ්‍ය සපයන, මානියම්ගම රජමහා විහාරාධිපතිව වැඩ විසූ සිටිනාමළුවේ ධර්මපාල නම් යතිවරයාණන් විසින් රචිත **සීතාවකරාජසිංහ රාජ්ජ කාලය** නම් පුස්කොළ ලේඛනය ප්‍රධාන මූලාශ්‍රය ලෙසත්, තවත් ප්‍රාථමික මූලාශ්‍රය රැසකුත් ඇසුරු කර ගන්නා මහාචාර්ය රිසිමන් අමරසිංහ මහතා[12] ද සීතාවක බැරැන්ඩි කෝවිල පිළිබඳ පර්යේෂණයක නියැළි ඩී. පී. ගමලත් මහතා[13] ද I රාජසිංහයන් විසින් සිය පියා වූ මායාදුන්නේ සාපරාධී ලෙස මරා දැමීමේ චෝදනාව නිෂ්ප්‍රභ කරති. අමරසිංහ සඳහන් කරන පරිදි ක්‍රි. ව. 1580 දී මායාදුන්නේ විසින් රාජසිංහයන්ට රජකම පවරන තෙක් පුරා විසි අවුරුද්දකටත් වැඩි කලක් ඔහු 'තත්වාකාර' රජකු ලෙස රට පාලනයෙහි නිතර වූ අතර ක්‍රි. ව. 1580 දී 'නීති ප්‍රකාරයට' රජකම ලැබීය, හෙවත් මායාදුන්නේ විසින් රජකම පැවරිණ. එසේ නම් රාජසිංහයන් විසින් මායාදුන්නේ මරනු ලැබූවේ හෝ මරවනු ලැබූයේ 'රාජ්‍ය ලෝභයෙනැයි' කීම ද රාජසිංහයන් විසින් මායාදුන්නේගේ කැමැත්තට පටහැනිව ඔහු රජකමෙන් පහ කැරිණැයි චෝදනා කිරීම ද හුදු කල්පිත සේ සැළකීමට සිදු වේ.[14]

I රාජසිංහයන් වෙත එල්ල වෙන අනෙක් ප්‍රබල චෝදනාව නම් හෙතෙම ශිව ආගම වැලඳගෙන බුදු සසුන හා සංඝ සමාජය විනාශයට පත් කළ බෞද්ධ විරෝධියෙකු ලෙස කටයුතු කිරීමයි. පීතෘ ඝාතක පාප කර්මය නොනැසිය හැකි බව සඟුන් කී බැවින් ඔවුන් හා උරණ වී බුදු සසුන නසා භික්ෂු සංඝයා මරවා ධර්ම පුස්තක දවා ආරාමයන් බිඳුවා ස්වර්ග මාර්ගය අවුරා ගත් බව ද, හින්දු ආගමට අනුව පාප කර්මය නැසි හැකි බව පැවසූ බැවින් ශිව භක්තිය ගෙන සමනොළ උපන් සියලු ලාභය ශිව භක්තික තවුසන්ට පැවරූ බව ද,

රාජසිංහයන් විසින් බුදු සසුනට කොතරම් වින කෙරුණි ද යත් රාජ භය හේතුවෙන් භික්ෂු සංඝයා සිවුරු හැර ගිය බව ද චූළවංසකරුවා චෝදනා මුඛයෙන් පවසයි.[15] මන්දාරම්පුර පුවත කතුවරයා[16] ද මේ චෝදනාව ම නඟයි. මහාචාර්ය අමරසිංහයන් තහවුරු කරන පරිදි රාජසිංහයන් පීතෘ ඝාතකයෙකු නොවූයෙන්, ඒ පාපයෙන් මිදීමට හෙතෙම බෞද්ධ විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ශිව සමය ගත් බැව් පිළිගත නොහැකි ය. **සීතාවක රාජසිංහ රාජ්ජ කාලය, මානියම්ගම පුස්කොළ ලිපිය** හා **අස්ගිරි තල්පත** ආදී පැරණි ලේඛනවලින් සාධක ගෙන හැර දක්වමින් ඔහු පවසා සිටින්නේ රාජසිංහයන්ගේ හදෙහි සංඝ විරෝධී ආකල්පයක් ජනිත වීම උඩරැටියන් රාජසිංහයන්ට එරෙහිව ගෙනගිය කුමන්ත්‍රණයක ප්‍රතිඵල බවයි.[17]

**සීතාවක රාජසිංහ රාජ්ජ කාලය** වාර්තා කරන පරිදි රාජසිංහයන් රාජ්‍ය ලෝභයෙන් පියා ඝාතනය කළේය යන අසත්‍ය කතාව විජේසුන්දර බණ්ඩාර හා දෙවනගල රතනාලංකාර හිමියන් රාජ්‍යයේ පතළ කළ නිසා ද ඔවුන් දෙදෙනාම එක්ව පෘතුගීසින් ලවා රාජසිංහයන්ගේ පුත් ධර්ම කුමරුන් උපක්‍රමයෙන් මැර වූ නිසා ද රාජසිංහයන් විසින් තමා ම උඩරට රාජ්‍යත්වයට පත් කළ විජේසුන්දර බණ්ඩාර බොරුවළක දමා මරවන ලදී.[18] ඉන් පසු රාජසිංහයන් විසින් නිකපිටියේ බණ්ඩාර 'රාජසූරිය' නමින් උඩරට රජ කරවීමෙන් පසුව උඩරට සංඝයා හා රදලවරු තමාට විරුද්ධව කුමන්ත්‍රණය කරන බව සැලව රාජසිංහ රජු බොහෝ සංඝයා හිර භාරයට ගැනීමටත්, සිවුරු හැරවීමටත් පටන් ගත් විට සංඝයා රාජභයින් පලාගිය බව අස්ගිරි තල්පත වාර්තා කරයි.[19] **මානියම්ගම පුස්කොළ ලිපිය** පවසන පරිදි මේ කුමන්ත්‍රණය පිටුපස සිටි ප්‍රධානීන් වූයේ සංඝ නායක පදවිය ලැබ මහත් බලයක් ඇතිව වැජඹුණු දෙවනගල රතනාලංකාර මාහිමියන් සහ අස්ගිරි පාර්ශ්වයේ අනුනායක පදවිය හෙබවූ පොහොයමළු විහාරාධිපති ගම්පොල රාජගුරු ධර්මකීර්ති හිමියන් ය.[20] ඔවුන් ඇතුළු මහා සංඝයාගේත් උඩරට රදලවරුන්ගේත් අපේක්ෂාව වූයේ නිකපිටියේ බණ්ඩාර සිහසුනෙන් නෙරපා දමා රාජසිංහගේ පසමිතුරු වූ කොනප්පු බණ්ඩාරට උඩරට රජකම පැවරීමයි. දෙවනගල රතනාලංකාර හිමියන් ද ගම්පොල රාජගුරු ධර්මකීර්ති හිමියන් ද රාජසිංහයන්ට විරුද්ධව කුමන්ත්‍රණය කළ බවට මානියම්ගම් පුස්කොළ ලිපිය කරන ප්‍රකාශය



තහවුරු වන්නේ මේ භික්ෂූන් දෙනමගේ පුරෝගාමිත්වයෙන් කොනප්පු බණ්ඩාර 'I විමලධර්මසූරිය' නමින් උඩරට රාජ්‍යත්වයට පත් වූ බැවිනි. මේ සංඝයා වහන්සේලාගේ රාජ්‍ය විරෝධී ක්‍රියාවලිය නිසා රාජසිංහ රජු කෙතරම් කෝප වී ද යත් සංඝයාගේ සිවුරු අරවා දඬු ගැසූ බව ද ඔවුන් අන්තොරජතයෙක් නැතිව විලාප නැගූ බව ද මානියම්ගම පුස්කොළ ලිපිය වාර්තා කරයි.[21] එසේම එහි සඳහන් වන ''.... දණ්ඩෙන් පහර ලත් ආශිර්විෂයක්හු සේ කිපී තව තව බොහෝ වූ සංඝයා නොමරා නමුත් අනවින පමුණුවමින් සිටි සඳ....''[22] යන ප්‍රකාශයට අනුව රාජසිංහයන් සඟුන් මැරවූ බවට කරන චෝදනාව බිඳ වැටේ. මේ සියලු සාධක ඇසුරින් නිගමනයකට එන අමරසිංහයෝ උඩරට සඟුන් හා රදලවරුන් රටේ ප්‍රබල රජු වන රාජසිංහයන්ගේ ආධිපත්‍යයට එරෙහිව කුමන්ත්‍රණය කරන විට අභිමානවත් දේශප්‍රේමී රජකු ලෙස රාජසිංහයන් ගත් එම ක්‍රියා මාර්ග සදොස් යැයි කිව නොහැකි බැවින් ඔහු බෞද්ධ විරෝධී ශාසන විරෝධී නායකයකු ලෙස හැඳින්වීම කවර න්‍යාය ධර්මයක පිහිටා වුව සාධාරණ කළ නොහැකි බව පවසති.[23] එසේම රාජසිංහයන් බුදු සමය කෙරෙහි නොපහන්ව ශිව සමය වැලඳ ශාසන විලෝපන ක්‍රියාවන්හි නිරත වූ බවට චූලවංසකරු නඟන චෝදනාව සසාධකව විචාරයට ලක්කරන හෙතෙම රාජසිංහයන් බෞද්ධාගම කෙරේ සැබැවින් ම නොපහන් වී ශිවාගම වැලඳ ගත්තේ නම් ඔහු කිසි දිනෙක එය අත් නොහරිනු නිසැක බවත් යළිත් බුදු දහම නොවැලඳගන්නා බවත් පවසයි. රාජසිංහයන් සිය මරණයට පෙර තෙරුවන් ගුණ සමරා, සඟුන් ගෙන්වා පිරිකර පවා පුදවා මිසදිටු හැර යළිදු බුදු දහම වැලඳ ගත් බව ඔහුට විපක්ෂව කරුණු කියන මන්දාරම්පුර පුවතේ ම[24] සඳහන් වේ. එබැවින් රාජසිංහයන්ගේ සංඝ විරෝධී ක්‍රියාවලිය රාජ්‍ය විරෝධී සඟුන් කෙරෙහි පමණක් එල්ල වූවක් බවත් හෙතෙම ශිව සමය ගත්තේ මෙබඳු සඟුන් කෙරෙහි පැවති නොපහත් චිත්තය නිසා බවත් පවසා I රාජසිංහයන් සියලු චෝදනාවලින් නිදොස් කොට නිවැරදි කරති.[25]

## ගනේගොඩ දේව විශ්වාසය හා සම්බන්ධ දේවාල

සීතාවක රාජසිංහයන්ට එරෙහිව නැගෙන චෝදනා සසාධකව විමර්ශනය කරන රිසිමන් අමරසිංහ මහතා එකී චෝදනාවන්ට පදනම වූයේ සීතාවක රාජධානියේ 'රාජසිංහ විපාක්ෂික' ගුරුකුලයක් බිහි වීම

බව පවසයි. රාජසිංහ මායාදුන්නේ රජුගේ පුතකු නොවන බවට සීතාවක රාජධානියේ පතළ කෙරුණු ප්‍රවෘත්තිය ද, රාජසිංහගේ මරණය ද මේ රාජසිංහ විරෝධීන්ගේ කුමන්ත්‍රණයක ප්‍රතිඵල බව තහවුරු කරන හෙතෙම රාජසිංහයන් රාජ්‍ය විරෝධී සංඝයාට හිරිහැර කළ නිසා ද ශිවාගම වැලඳ ගැනීම නිසා ද 'රාජසිංහ විපාක්ෂික' වංසකතාකරුවන්ගේ ගුරුකුලයක් බිහි වී එම චෝදනාත්මක දුර්මත පාරම්පරිකව පැවත ඒමේ ප්‍රතිඵලයක් වශයෙන් කුතෝ ආදීන්ගේ විදේශීය වාර්තාවලට ද චූළවංසය ඇතුළු සෙසු මූලාශ්‍රයවලට ද පිවිසෙන්නට ඇති බව පවසයි.[26] රාජසිංහ විපාක්ෂික ගුරුකුලයේ අදහස් ජන විඥානයට කෙතරම් බලපෑමක් කළේ ද යත් ජනප්‍රවාදවලට අනුව ද සීතාවක රාජසිංහ වරදකරුවෙකි. ඒ අදහස එකල ජන සමාජයේ උපරි ව්‍යුහය නියෝජනය කළ භික්ෂූන් වහන්සේලා හා රදලයින් ඇතුළත් ප්‍රභූන් විසින් ජනගත කරන ලද්දක් මිස පොදු ජනමතයක් ලෙස අර්ථ දැක්විය නොහැකි ය. රාජසිංහ විපාක්ෂික ගුරුකුල අදහසට අනුව, ඔහු කළේයැ යි කියන වරදට ජනතාව විසින් ම සමාව දී I රාජසිංහ චරිතය නැවත සිංහල ජන සමාජය හා සුසන්ධීකරණය කළ අයුරු මරණින් මතු ඔහුට ගනේගොඩ දේවතාවා නමින් දේවෝත්පත්තියක් ලබා දීමෙන් තහවුරු වේ.

සීතාවක රාජසිංහ රජුගේ මරණින් පසු ලියැවුණු ලංකාවේ දේව ශාසනය හා ලංකා ඉතිහාසය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් **දේවාල උපත** නම් පුස්කොළ පොත රාජසිංහයන්ගේ දේවෝත්පත්තිය තහවුරු කරන ප්‍රධාන ලිඛිත මූලාශ්‍රය ලෙස සඳහන් කළ හැකි ය. රාජසිංහයන් විසින් තම පියා ඝාතනය කරනු ලැබීම පිළිගත නොහැකි බවට කොතෙකුත් තර්ක විතර්ක ඇතත් ''.... රාජසිංහ කුමරා පියරජ අයාමෙන් රජ පැමිණ පිය රජ හට හදිකොට මැරුවේ ය.''[27] යනුවෙන් පවසන **දේවාල උපත** එය සත්‍ය සිදුවීමක් ලෙස පිළිගනී. රාජසිංහයන් විසින් සිදුකරන ලද සෙසු ශාසන විලෝපන ක්‍රියා විස්තර කර ඇති අන්දමට දේවාල උපතේ ඇතුළත් ඉතිහාස තොරතුරු චූළවංසය ඇසුරින් ගොඩනගා ඇති බව පැහැදිලි වේ. මේ ලේඛනය අවසන් වන්නේ ''.... ඉන් පසු එම දෙවරාජසිංහ රජ තෙම බමුණන්ගෙ බසින් සීතාවක දේව බ්‍රැන්ඩි කෝවිල කරවන අතර නිමවිය නොහී එරජ ස්වර්ගයාත්‍රා වූහ. නොහොත් ගනේගොඩ දේවතාව උපන්නේ යයි ලෝක වැවහාර විය.''[28] යනුවෙන් I රාජසිංහයන්ගේ දේවෝත්පත්තිය පිළිබඳව ද සඳහන් කරමිනි.



දේවාල උපත සඳහන් කරන අන්දමට බුදු සසුන නසමින් අධර්මයෙන් රාජ්‍යය කරන I රාජසිංහයන් දේවශාසනය වර්ධනය කිරීමේ අදහසින් දේවාල කරවීම අරඹා තිබේ. ඔහු විසින් එසේ කරවන ලද පත්තිනි දේවාල හතළිස් අටකි (48).[29] තම අමාත්‍ය මණ්ඩලයේ ඇමතිවරුන් දොළොස් දෙනෙකුට කපු තනතුරු දී ඒ දේවාල හතළිස් අටෙන් දොළසක් (12) ප්‍රධාන දේවාල බවට පත් කළ බව දේවාල උපත වාර්තා කරයි. නමුත් එහි දේවාල 13ක නම් ඇතුළත් වේ. එම ප්‍රධාන දේවාල හා ඒවායේ භාරකාරත්වය ඉසුලූ කපුමහතුන් මෙපරිද්දෙනි.

| | | | |
|---|---|---|---|
| i. | මැදගොඩ දේවාලය | - | මැදගොඩගෙයි ගම්ලත් අප්පු |
| ii. | කබුලුමුල්ල දේවාලය | - | කබුලුමුල්ලේ කොහොලානේ ගම්ලත් අප්පු |
| iii. | මියනඹිවිට දේවාලය | - | මියනඹිවිට හිඟුරේ අප්පු |
| iv. | සපුගම්මන දේවාලය | - | සපුගම්මන කන්දේගෙදර ගම්ලත් අප්පු |
| v. | අමනාවල දේවාලය | - | අමනාවල වික්‍රමආරච්චිගෙ ලියන අප්පු |
| vi. | අරුග්ගම්මන දේවාලය | - | අරුග්ගම්මන ගම්ලත් අප්පු |
| vii. | සොලොන්පුවෙ දේවාලය | - | සොලොන්පුවෙ හේරත් අප්පු (හොලොම්බුව) |
| viii. | තඹදියෙ දේවාලය | - | තඹදියෙ ලේකම් අප්පු |
| ix. | අමිතිරිගල දේවාලය | - | අමිතිරිගල ගම්ලත් අප්පු |
| x. | තියඹරාහේන දේවාලය | - | තියඹරාහේන සේනැකගේ (සේනානායකගේ) ලේකම් අප්පු |
| xi. | උඩුවේ දේවාලය | - | උඩුවේ ගරු ලේකම් අප්පු |
| xii. | පැලැල්ලේගම දේවාලය | - | පැලැල්ලේගම ගම්ලත් අප්පු |
| xiii. | ගබ්බල දේවාලය | - | ගබ්බල ලේකම් අප්පු[30] |

මේ පත්තිනි දේවාල අතුරින් දෙකක I රාජසිංහයන්ගේ දේවාත්මභවය වන ගනේගොඩ දේවතාවා ද පිදුම් ලබයි. ඒ, පැරණි සීතාවක රාජධානියට අයත් **මැදගොඩ පත්තිනි දේවාලය** සහ **කබුලුමුල්ල පත්තිනි දේවාලයේ** ය. ඊට අමතරව හාපිටිගම් කෝරලේ

**මීරිගම බොකලගම පත්තිනි දේවාලයේ** ද ගනේගොඩ දෙවියන් පිදුම් ලබන අතර මෙය පුරාණයේ සීතාවක පැවති ගනේගොඩ දේවාලය පෘතුගීසි ආක්‍රමණ හේතුවෙන් රට මැදට ගෙනයාමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූවක් බව එම දේවාලයේ කපු පරපුරේ විශ්වාසයයි.[31] ඇතැමෙක් විශ්වාස කරන පරිදි බොකලගම යනු ටිකිරි කුමරු කුඩා කල වාසය කළ ග්‍රාමයයි. මේ ගමෙහි මාළිගාතැන්න නමින් ප්‍රකට අක්කර හතරක පමණ වන භූමි භාගයක රජ මාළිගයක නටබුන් දැකගත හැකි වේ. ඒ අතර ගල්කණුවලින් යුත් ගොඩනැගිලි පාදමක්, සඳකඩපහණක් සහ රජු දිය නෑ පොකුණ ලෙස සැළකෙන නොසිඳෙන ගල් පොකුණක් ද වෙයි.[32] වර්තමානයේ මෙහි පත්තිනි දෙවියන් ප්‍රධාන දේවතාවා ලෙස පුද ලැබුව ද දේව කන්නලව්වෙහි ගනේගොඩ දෙවියන් පිළිබඳ කියැවේ.

මේ දේවාල ත්‍රිත්වය අතුරින් ගනේගොඩ දෙවියන් හා සම්බන්ධ විශ්වාසය දැඩිව මුල්බැසගත් දේවාලය වශයෙන් **කබුලුමුල්ල රජමහා පත්තිනි දේවාලය** හඳුන්වා දිය හැකි ය. 1582 දී සීතාවක රාජසිංහයන් විසින් පත්තිනි දෙවියන් උදෙසා ඉදි කරන ලද බවට විශ්වාස කෙරෙන මේ දේවාලයේ භාරකාරත්වය උසුලනුයේ අභය රණසිංහ මුදියන්සේ පරම්පරාවයි. ඔවුන්ට දේවාල භාරකාරත්වය හිමි වූ ආකාරය කියැවෙන මුඛ පරම්පරාගත කතා පුවතක් වෙයි. එහි දැක්වෙන අන්දමට සීතාවක රජවාසල ප්‍රධාන සේනාධිපතිවරයකුව සිටි රණසිංහ මුදියන්සේ නැමැත්තෙක් රාජ උදහසට ලක්ව මරණීය දණ්ඩනය නියම වී සිටියේ ය. එවකට ඔහුගේ ම සහෝදරයකු දේවාලකන්ද මංගෙදරමුල්ල නම් වූ ස්ථානයක දෙවොලක් පවත්වමින් රජුට එරෙහිව දේව කන්නලව් හෝ පලිගැසීම් ආදී කටයුතුවල යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස, කිසියම් අදෘශ්‍යමාන බලවේගයක් රජු සිහිනෙන් බිය වද්දා, නිදා සිටි ඇඳෙන් බිමට ඇද දමා ඔහු විසින් පනවන ලද මරණීය දණ්ඩනය අසාධාරණ තීන්දුවක් බව ප්‍රකාශ කර සිටියේ ය. පසුව සීතාවක රාජසිංහ රජතුමා අමාත්‍ය මණ්ඩලයෙන් කරුණු විමසා රණසිංහ මුදියන්සේට අභය දානය දී අභය රණසිංහ මුදියන්සේ යන නාමය ද සහිතව, කබුලුමුල්ල දේවාලය ඉදිකරවා ඔහුට භාරකාරත්වය පවරා දුන් බව කියැවේ.[33] වර්තමානය දක්වා ම අභය රණසිංහ මුදියන්සේ පරම්පරාව විසින් කබුලුමුල්ල පත්තිනි දේවාලයේ භාරකාරත්වය උසුලන අතර මේ



වන විට එහි භාරකරු වශයෙන් කටයුතු කරන්නේ අභය රණසිංහ මුදියන්සේලාගේ චන්ද්‍රසිරි ඉන්ද්‍රජිත් කුඩා බණ්ඩාර මහතා ය.

වර්තමානයේ මෙම දේවාලයේ ප්‍රධාන දේවතාවා වශයෙන් පත්තිනි දෙවියන් පිදුම් ලබන අතර ගනේගොඩ දෙවියෝ ද බලගතු වැරදිවලට දඬුවම් දෙන දෙවියකු වශයෙන් පූජාවට පාත්‍ර වෙති. මෙම දේවාලයෙහි පත්තිනි දේව ප්‍රතිමාවට අමතරව ඉතා අලංකාර ලෙස නිමවන ලද ගනේගොඩ (I රාජසිංහ) දෙවියන්ගේ ප්‍රතිමාවක් ද වෙයි. දේවාලයෙහි පවත්නා ප්‍රධාන පූජා භාණ්ඩ අතර පත්තිනි දෙවියන් සංකේතවත් කරන පත්තිනි සලඹට අමතරව I රාජසිංහ රජු විසින් භාවිත කරන ලද සඳුන් ඇඳ වියල, කඩුව සහ පලිහ, කිණිස්ස සහ මුගුරු රැසක් ද ඇත. අගෝස්තු මාසයේ පැවැත්වෙන ඇසළ මහා පෙරහැර මංගල්‍යයෙහි දෙවන කුඹල් පෙරහැර දින උදේ කාලයේ දී ගනේගොඩ දෙවියන්ගේ මේ දේවායුධ පෙරහැරෙහි වැඩම වන අතර පසුව දෙවියන් වෙනුවෙන් මුරුතැන් පිදීමක් ද සිදුවේ.[34]

## I රාජසිංහ චරිතය, ගනේගොඩ දෙවියෝ සහ ජනමතය

කලක් ජන සමාජයෙහි ජීවත් වූ මිනිසකු මරණින් මතු දෙවියකු බවට පත් කොට ස්වකීය ඇදහිලි හා විශ්වාස පද්ධතිය හා සම්බන්ධ කර ගනු ලබන්නේ එකී සමාජයට ම අයත් ජනතාව විසිනි. ඒ අනුව I රාජසිංහ චරිතයට ගනේගොඩ දෙවියන් නමින් දේවෝත්පත්තියක් ලබා දීමේ දී ජනමතය ක්‍රියාත්මක වූ ආකාරය විමසා බැලීම වැදගත් ය. I රාජසිංහ චරිතය හා ගනේගොඩ දෙවියන්ගේ උත්පත්ති කතාව අතර පවතින සම්බන්ධය අවබෝධ කර ගැනීමේ දී කබුලුමුල්ල දේවාලයෙහි උත්සවවල දී ගැයෙන **ගනේගොඩ යාදින්න** නම් වූ දේව සැහැල්ලත්, **ගනේගොඩ දෙවියන්ගේ කීම** නමින් හැඳින්වෙන පද්‍ය එකතුවත් වැදගත් මූලාශ්‍රය දෙකක් වෙයි.

සුර රජ සිරි විඳින - සිරි විජයබා නමින
එපුර රජ කරන සොඳ - එරජ අග බිසව සඳ
පිසස් ලෙඩ පැමිණි විට - බමුණුදුරු සමග එක්
සඟ නමක් මතුරු කොට - පිසසුන්ද ගෙන එවිට
යසස පෙන්වී ලොවට - කිව් එදෙන්නා එවිට

බිසවුන්ට බැඳි සෙනේ - පෙර සිට ම එන බැවින්
බිසව කුස පිළිසිඳී - දස එකඩ මස් සපිරි
උපන් කුමරිඳු බලැති - රාජසිංහ යන නමින්
පුර සඳසෙ වැඩී සොඳ...[35]

යනුවෙන් ගැයෙන ගනේගොඩ යාදින්නට අනුව මායාදුන්නේ රජුගේ බිසවට උපන් කුමරා හෙවත් ටිකිරි බණ්ඩාර (I රාජසිංහ) යක්ෂයකුගේ පුනර්ජන්මයකි. එම විශ්වාසයට අනුව මායාදුන්නේ බිසවට යක්ෂයකු ආරූඪ වූ බවත් ඉන් ඇය මුදවාලීමට භික්ෂූන් පිරිත් දේශනා කළ බවත් ඉන් කෝපාවිෂ්ට වූ යක්ෂයා භික්ෂූන් විනාශ කිරීමට ශපථ කරගෙන බිසවගේ කුස උපත ලබා පසු කලෙක භික්ෂූන් විනාශ කළ බවත් කියැවේ.

පද්‍ය 72කින් සමන්විත **ගනේගොඩ දෙවියන්ගේ කීම**[36] නම් වූ කවි එකතුවෙහි ඇතුළත් කතා පුවත මීට වඩා සවිස්තරාත්මක ය. එහි සඳහන් වන අන්දමට යක්ෂ දිෂ්ටියට පළමුව ලක්වන්නේ කෝට්ටේ බුවනෙකබා රජුගේ බිසවයි.

සාර ගුණැති එපුරෙහි මන නන් දා
ගෝර රුපුන් බිඳ ජය ගනිමින් දා
නැර එපුර සිරි සැපත විඳින් දා
දීර එබුවනෙකබාහු නිරින් දා (10 පද්‍යය)

දුලා වඩන බිසවුන් රුව දැක ලා
හෙලා දේවතා දිස්ටිය වැටි ලා
මුලා වෙමින් සිටු මත් කරවා ලා
නොලා ම නිඳි යහනේ සැතපී ලා (13 පද්‍යය)

බිසවගේ ස්වරූපය දැක බිය වන බුවනෙකබාහු රජතුමා ඇමතීන් ගෙන්වා විමසා, යක්ෂයකු විසින් බිසව ලෙඩ කරන බව දැන දක්ෂ ඇදුරන් ලවා ඇය සුවපත් කර ගැනීමට කටයුතු යෙදුවේ ය. නමුත් ඉන් පලක් නොවූ තැන බිසව සුවපත් කිරීමට සමතෙකු සොයමින් රට පුරා අණබෙර ලැවී ය. ඊට ප්‍රතිචාර දක්වමින් එක් භික්ෂුවක් රජ මැඳුරට පැමිණ පිරිත් කියා බිසවගේ යක්ෂ දිෂ්ටිය සිරුරෙන් ඉවත් කළේ ය. මේ කවිකතාවේ සඳහන් ආකාරයට බුවනෙකබා බිසවගේ සිරුරට අරක්ගත් යක්ෂයා ඉන් මිදී සීතාවක මායාදුනු රජුගේ බිසවට ආරූඪ වූයේ ය.



''ගොසින් එ සීතාවක් පුර මෙර ගේ
නමින් එ මායාදුන්නේ රජු ගේ
පෙමින් බොලඳ රුසිරු බිසවුන් ගේ
ගොසින් එතැන වැසුනයි තද උර ගේ (21 පද්‍යය)

බිසවගේ ස්වරූපය දැක බියපත් වූ මායාදුන්නේ රජු ද විවිධ යකැදුරන් ගෙන්වා ඇය සුවපත් කර ගැනීමට උත්සාහ දරා ඒ සියල්ල ව්‍යර්ථ වූ තැන මසු දහසක් ඇතුපිට බැඳ බිසව සුවපත් කිරීමට සමතෙකු සොයා අණබෙර ලැවී ය. මේ අවස්ථාවේ මායාදුනු බිසව සුවපත් කිරීමට ඉදිරිපත් වූයේ ද බුවනෙකබා බිසව සුවපත් කළ භික්ෂූන් වහන්සේම ය.

''තෙරිඳුට මහ රජ මෙපවත් කිව් වේ
හනිකට දොස් දුරලන්නට කිව් වේ
නිසිකොට ආතුරයින් ගෙන් වූ වේ
වී තුට රඹ පෙල අවට සැදූ වේ (30 පද්‍යය)

සිරිත් ලෙසට යකු ගෙන්වා ගන්න ට
පිරිත් හුයක් බැඳලා එහි වට කො ට
කයත් සලිත කර ආවෙස වී සි ට
කියත් මෙලෙස බැඳ ගන්න සැදූ වි ට (31 පද්‍යය)

මින්මතු සඟයින් දුටු තැන වනසමි
සුන්කර දුටු තැන කුලල් කඩා කමි
බන්ධන කළ සඟ පෙළ මුල වනසමි
මම් මේ ලෙස දුටු දුටු තැන උපදමි (32 පද්‍යය)

මහත් ක්‍රෝද සිත් එදා උපන් නේ
උවත් ක්‍රෝද බල අත් නාරින් නේ
තවත් චුතව එතැනින් නියතින් නේ
ඇවිත් එබිසවගෙ කුසේ උපන් නේ (33 පද්‍යය)''

මේ පද්‍යාවලින් කියැවෙන ආකාරයට භික්ෂූන් වහන්සේ සිරිත් පරිදි පිරිත් කියා යක්ෂයා බැඳලන්නට උත්සාහ කළ අවස්ථාවේ ආවේෂ වූ යක්ෂයා, මින්මතු භික්ෂූන් දුටු තැන වනසන බවටත්, ගෙල කඩා දමන බවටත්, තමාව බන්ධන කළ සංඝ සමූහයාගෙන් පලි ගනිමින් මතු මතුත් උපදින බවටත් ශපථ කළේ ය. එසේ වෛර බැඳගත් හෙතෙම බිසවගේ සිරුරෙන් ඉවත්ව ඇගේ කුසයේ පිළිසිඳ ගත් බව සඳහන් ය. ඉන් අනතුරුව පිළිවෙළින් ටිකිරි බණ්ඩාර කුමරුගේ උත්පත්තිය, මායාදුන්නේ රජුගෙන් රාජ්‍යය ඉල්ලා සිටීම, රජු ඊට විරුද්ධ වීම, පියා ඝාතනය කරවීම, ශිව දහම වැළඳ ගැනීම, භික්ෂූන් විනාශ කිරීම, සමනොළ ආඬින්ට පැවරීම, බැරැන්ඩි කෝවිල ඉදිකිරීම, ඒ අතර මරණයට පත්ව ගනේගොඩ දෙවියන් ලෙස උපත ලැබීම ආදී රාජසිංහ චරිතය හා සම්බන්ධ සිදුවීම් මේ කවිකතාවෙහි විස්තර වේ. රාජසිංහයන්ට විපාක්ෂික බලවේගවලට, පක්ෂ බලවේග අතික්‍රමණය කරමින් නැඟී සිටීමට සුදුසු පරිසරයක් එකල ගොඩනැඟී තිබූ බැවින් රාජසිංහයන්ට චෝදනා කළ වංසකතාකරුවන්ගේ අදහස් පොදුජන විඥානයට එක් වීම වැළැක්විය නොහැකි කරුණකි. එබැවින් ගනේගොඩ යාදින්න, ගනේගොඩ දෙවියන්ගේ කීම වැනි පොදු ජන නිර්මාණවලින් පවා ප්‍රතීත වනුයේ රාජසිංහ විරෝධී ආකල්පයකි. නමුත් ඒ ප්‍රභූ පැලැන්තිය විසින් පොදු ජන විඥානයෙහි තැන්පත් කළ රාජසිංහ විරෝධයට යටින් සියුම්ව දිවෙන, යුද වීරයෙකු වූ රාජසිංහයන් කෙරෙහි වන පොදු ජන ගෞරවය මේ දේව සැහැලි සියුම්ව නිරීක්ෂණය කිරීමෙන් හඳුනා ගත හැකි ය. එකී රාජසිංහ හිතවාදී ආකල්පය හඳුනාගත හැකි අවස්ථාව ලෙස අප දකිනුයේ පොදු ජන නිර්මාණකරුවා රාජසිංහයන්ගේ පූර්වාත්මභවය යක්ෂයෙකු ලෙස දැකීමයි. රාජසිංහ ලෙස උපත ලබන්නේ වරින්වර රජ බිසෝවරුන්ගේ රුවට වශීකෘතව ඔවුන්ට දිෂ්ටි හෙළූ යක්ෂයෙකි. ඒ යක්ෂයා භික්ෂූන් කෙරෙහි වෛර බඳින්නේ ආරූඪ වී සිටි ආතුරයාගෙන් තමා වෙන් කොට බන්ධනය කරන්නට උත්සාහ කළ බැවිනි. ඊට අනුබල දුන්නේ මායාදුන්නේ රජු ය. එහෙයින් හේ ඔහුට පුත්ව ඉපිද පීතෘඝාතකයෙක් විය; භික්ෂූන්ට වින කළේය; බුදු සසුනට එරෙහි විය. තත්කාලීන සමාජයේ ජනමත නායකයන්ව කටයුතු කළේ භික්ෂු සමාජයත් රජු ප්‍රමුඛ රදල පන්තියත් ය. I රාජසිංහයන් පීතෘ ඝාතකයෙකු ලෙස ද බෞද්ධ විරෝධියෙකු ලෙස ද හුවා දක්වමින් ජනමතයක් ගොඩනඟන ලද්දේ මොවුන් විසිනි. ඒ ජනමතයට එරෙහිව ඍජුව



නැගී සිටීම පොදු ජනතාවට කළ නොහැක්කකි. එහෙත් පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළ යුද වීරයෙකු හා සීතාවක රාජධානිය උච්චස්ථානයට නැංවීමෙහිලා ක්‍රියා කළ අසහාය පාලකයෙකුගේ කාර්ය සාඵල්‍යය ද ඔවුනට අමතක කළ නොහැක්කකි. එහෙයින් පොදු ජනතාව රාජසිංහයන් කළ වැරදි ඔහුගේ පූර්වාත්මභවය හා බැඳුණු යක්ෂ ආත්මයකට බැඳ තබා ඔහුට සමාව දුන්හ; මරණින් මතු නැවත දෙවියකු බවට පත් කොට ගෞරව කළහ.

මායාදුන්නේගේ මරණය පිළිබඳව කබුලුමුල්ල ප්‍රදේශයේ ප්‍රචලිතව පවත්නා ජනප්‍රවාදයකට අනුව ද පොදු ජනතාව සීතාවක රාජසිංහයන් පීතෘ ඝාතකයෙකු ලෙස හැඳින්වීමට අකැමති වූ බව පැහැදිලි වේ. එහි කියවෙන අන්දමට රාජසිංහයන් කඩු හරඹයෙහි ප්‍රවීණයෙකි. උස පුවක් ගසක් කඩුවෙන් පෙති ගසා එහි අවසන් පෙත්ත බිම වැටෙන්නට පළමු කඩු තුඩින් ගැනීමට හේ සමතෙක් වී ලු. ඔහු කඩු හරඹ පුහුණුවෙහි යෙදුණේ රහසිගතව ය. දිනක් සිය පුතණුවන්ගේ සුරුකම් දකිනු රිසියෙන් මායාදුන්නේ රජතුමා රාජසිංහයන් කමතක කඩු හරඹ පුහුණු වන මොහොතක පිදුරු ගොඩක සැඟවී බලා සිටියේ ය. පුහුණුව අවසානයේ දී රාජසිංහ කුමරා අසල වූ පිදුරු ගොඩට කඩුවෙන් ඇන්න බවත්, කඩුව කිසියම් තද දෙයක ගැටුණු බව දැන කඩුව ඉවතට ගත් මොහොතේ එහි ලේ තැවරී තිබුණු බවත්, පසුව පිදුරු ගොඩ පාදා බැලූ විට කඩු පහරින් තුවාල ලත් මායාදුන්නේ රජු මියගොස් සිටි බවත් කියැවේ[37]. රාජසිංහ විපාක්ෂික කඳවුර නියෝජනය කළ වංසකතාකරුවා මායාදුන්නේගේ මරණය රාජසිංහයන් බල ලෝභයෙන් කළ මිනී මැරුමක් ලෙස අර්ථ දැක්වුවත් පොදු ජනතාව ඔහු නිර්දෝෂී පුද්ගලයෙකු ලෙස දුටු බව මේ ජනප්‍රවාදයෙන් තහවුරු වේ.

## නිගමනය

සිංහල රාජාවලියෙහි රට දැය වෙනුවෙන් සුවිසල් සේවාවක් කළ නර ශ්‍රේෂ්ඨයන් රැසකි. නමුත් ඒ හැම ශ්‍රේෂ්ඨ රජෙකුම දෙවියෙකු බවට පත් වූයේ නැත. දුටුගැමුණු, මහා පරාක්‍රමබාහු, බුද්ධදාස, සිරිසඟබෝ වැනි ජන හදවත්වල අමරණීයත්වයට පත් වූ ධාර්මික රජවරු ද දේවත්වයට පත් නොවූ රජවරු අතර වෙති. ඔවුන් මෙන් ශ්‍රේෂඨත්වයෙහිලා නොසැලකුණ ද මාදම්පේ තනියවල්ලභ (VIII වීර පරාක්‍රමබාහු පුත්), සපුමල් බණ්ඩාර (VII බුවනෙකබාහු), ශ්‍රී

වික්‍රම රාජසිංහ ආදී රජවරු ද, කළුදැකඩ, සෙංකඩගල කළුකුමාර, උඩුගම්පල කළුකුමාර, ගලේ බණ්ඩාර, කුමාර බණ්ඩාර ආදී රාජ කුමාරවරු ද මරණින් මතු දේවත්වයට පත්ව තිබේ. පෙර සඳහන් කළ පරිදි ජන ආගමෙහි දෙවියන් බවට පත්ව ඇත්තේ ජීවත්ව සිටිය දී යහපත කළ අයම පමණක් නොවේ. සමාජය කම්පනය කිරීමට සමත් වූ යහපත් හෝ අයහපත් දෙයකට මුල් වීම දේවත්වයට පත්වීමට සුදුසුකමක් වී තිබේ. බුදුසමයට පෙර ආර්යයන් විසින් දේවත්වයට පත් කරන ලද ඉන්ද්‍ර වැන්නෝ යහගුණ නිසා නොව සිය යුද්ධ දක්‍ෂතාවත් බිහිසුණුකමත් නිසා ගෞරවයට පාත්‍ර වූවෝ වෙති.[38] ඒ අනුව පෘතුගීසීන් අන්ත පරාජයට පත් කළ යුද වීරයකු වී, පීතෘ ඝාතකයකු හා බෞද්ධ විරෝධියෙකු ලෙස සමාජ අපවාදයට ලක් වූ I රාජසිංහයන් ගනේගොඩ දෙවියන් ලෙස දේවත්වයට පත් වූයේ ඔහුගේ දක්‍ෂතාව හා බිහිසුණුකම නිසා ද? මීට පිළිතුරු සැපයීමේ දී මින්නේරි දෙවියන් හා සම්බන්ධ ජනශ්‍රැතියෙන් කිසියම් ආලෝකයක් ලැබිය හැකි ය. මින්නේරි දෙවියන් ලෙස දේවාත්මභවයක් ලැබුවේ ශ්‍රී ලාංකේය වාරි කර්මාන්ත ක්ෂේත්‍රයෙහි නොමැකෙන සටහන් තබන ලද නර වීරයකු  වූ මහසෙන් රජතුමා ය (ක්‍රි. ව. 274-301). හෙතෙම බරපතල සමාජ ගැටලුවලට මුහුණ දුන් පාලකයෙකි. ඓතිහාසික කරුණු විමසීමේ දී පැහැදිලි වන ආකාරයට ප්‍රථමයෙන් මහාවිහාරයට විරුද්ධව කටයුතු කළ මහසෙන් පසුව කෘෂිකර්මාන්තය නැංවීමට විශාල සේවයක් කළේ ය; වැව් 16ක් හා මහා වෙහෙර විහාර ඉදිකරමින් ජනතාවගේ සිත් දිනාගත්තේ ය. මහසෙන් මින්නේරි දෙවියන් ලෙස උපත ලැබුවේ සමාජ අරගල මධ්‍යයේ මිනිසුන්ගේ යහපත උදෙසා ඉදිකරන ලද වාරිකර්මාන්තයේ මුදුන් මිණ බඳු වූ මින්නේරිය ආරක්‍ෂා කරන දෙවියන් ලෙස ය. මේ සියලු සාධක නිරීක්‍ෂණයෙන් තහවුරු වන්නේ මහසෙන් දේවෝත්පත්ති කතාවෙහි ගැබ්ව ඇත්තේ කාලයක් අධර්මිෂ්ඨ වූ තැනැත්තෙක් පසුව ‘ධර්මිෂ්ඨ’ වී දෙවියකු බවට පත්වීමේ ප්‍රවෘත්තියයි.[39] මහසෙන් හා සංසන්දනය කිරීමේ දී I රාජසිංහයන් පළමුව ධර්මිෂ්ඨව සිට පසුව අධර්මිෂ්ඨ වූ පාලකයෙකි. ඒ හුදෙක් ඔහුගේ වරදින් නොව රාජසිංහ විපාක්ෂික සංඝ හා රදල සමාජයේ කුමන්ත්‍රණවල ප්‍රතිඵලයක් වශයෙන් බව අප පූර්වයෙහි තහවුරු කළෙමු. නමුත් ඔහු විසින් සිදු කරන ලද ජනතා සේවය ජන හදවත්වල නොමැකෙන සේ සටහන්ව තිබිණි. රාජසිංහයන් දරුණු



පුද්ගලයකු වීමට හේතු වූ කාරණාවක් ඔහුගේ පූර්වාත්මභවය හා සම්බන්ධ කොට ඔහුට සමාව දී ගනේගොඩ දෙවියන් ලෙස දේවාත්මභවයක් ලබා දී ගෞරවයට පාත්‍ර කළේ එබැවිනි. සමාජය යළි ස්ථාපිත කිරීම හෙවත් පුනරුත්ථාපනය ඉතා වැදගත් සංකල්පයකි. සමාජ විරෝධී ක්‍රියාවක නිරත වූ තැනැත්තා නිසර්ගයෙන් ම සමාජය විසින් පිළිකෙව් කෙරේ. වර්තමාන සමාජයේ ඒ තැනැත්තා නැවතත් සමාජය හා සම්බන්ධ කරන ක්‍රමවේදයක් නොමැත. නමුත් අතීතයේ ජනශ්‍රැතිය හැසිරුණු ආකාරය අනුව එබඳු පුද්ගලයෙකුට සමාජ පුනරාගමනයට අවස්ථාව තිබූ බව පෙනේ.[40] I රාජසිංහයන් හා සම්බන්ධ දේවෝත්පත්ති කතාව හෙවත් ගනේගොඩ දේවතා සංකල්පය ද එබඳු පුනරාගමනයකි; කළ වැරදිවලට සමාව දී නැවත සමාජය හා බද්ධ කිරීමේ සුසන්ධීකරණ (Restitution) ක්‍රියාදාමයකි.

**ආන්තික සටහන්:**

1. කේ. එන්. ඕ. ධර්මදාස සහ එච්. එම්. එස්. තුන්දෙනිය, **සිංහල දේව පුරාණය**, (කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, 1994), 68 පිටුව.
2. නන්දසේන රත්නපාල, **ජනශ්‍රැති විද්‍යාව**, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2007), 173 පිටුව.
3. **සිංහල දේව පුරාණය**, 48 පිටුව.
4. **එම**, 49 පිටුව.
5. ඒ. වී. සුරවීර, (සංස්) **රාජාවලිය**, (කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1997), 232 පිටුව.
6. නීල් රණවක, **සීතාවක රාජධානියේ නොනිමි මෙහෙවර**, (කොළඹ: සූරිය ප්‍රකාශකයෝ, 2001), 137 පිටුව.
7. W. Geiger, (ed.) Culavamsa, (Colombo: P.T.S., 1923 and 1927). 93:4.
8. Journal of the Royal Asiatic Society, Ceylon Branch, Vol.xx, No 60, "The History of Ceylon, from the earliest times to 100 as related by Joao de Barros and Diogo do Couto" (Colombo, 1973) p. 271.
9. **රාජාවලිය**, 223 පිටුව.
10. රෝහිණී පරණවිතාන, (සංස්.) **සීතාවක හටන**, (කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1999), 149 පිටුව.
11. Rev. S. G. Perera (Trans.) The Temporal Spiritual Conquest of Ceylon, Vol. i-iii by Fernao de Queyroz, (Colombo: 1930), 323-324, 431 pp.
12. රිසිමන් අමරසිංහ, **සීතාවක රාජධානියේ උන්නියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්**, (මහරගම: තරංජී ප්‍රින්ටර්ස්, 1998)
13. ඩී. පී. ගමලත්, **සීතාවක බැරැන්ඩි කෝවිල**, (කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 1996), 59-79 පිටු.
14. රිසිමන් අමරසිංහ, **සීතාවක රාජධානියේ උන්නියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්**, (මහරගම: තරංජී ප්‍රින්ටර්ස්, 1998), 115 පිටුව.

15. ශ්‍රී සුමංගල මාහිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, (සංස්.) **මහාවංසය (සිංහල)**, (කොළඹ: 1963), 93 පරිච්චේදය.
16. ලබුගම ලංකානන්ද හිමි, (සංස්.) **මන්දාරම්පුර පුවත**, (කොළඹ: අනුල මුද්‍රණාලය, 1958), දෙවැනි අදියර.
17. සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්, 165-175 පිටු.
18. සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්, 166 පිටුව.
19. මැන්දිස් රෝහණදීර, (සංස්.) **අස්ගිරියේ තල්පත**, (ගංගොඩවිල: 1969), 14 පිටුව.
20. සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්, 227 පිටුව.
21. එම, 227 පිටුව.
22. එම, 228 පිටුව.
23. එම, 168-169 පිටු.
24. මන්දාරම්පුර පුවත, 88 පද්‍යය.
25. සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්, 174 පිටුව.
26. එම, 116 පිටුව.
27. එම්. ඩී. එම්. එස්. යටවර, (සංස්.) **දේවාල උපත**, (කොළඹ: ආරිය ප්‍රකාශකයෝ, 2005), 32 පිටුව.
28. **දේවාල උපත**, 36 පිටුව.
29. එම, 33 පිටුව.
30. එම, 33-34 පිටු.
31. වෛරහැර ආරියවංශ හිමි, (සංස්.) **සීතාවක පුර යුගය**, ''සීතාවක යුගයේ ඓතිහාසික සටහන්'' යසපාල, කේ. පී. (කොළඹ: සමයවර්ධන මුද්‍රණාලය, 1991) 38 පිටුව.
32. **සීතාවක පුර යුගය**, 38 පිටුව.
33. Kabulumulla Devalaya.com.
34. H TV ආයතනය විසින් නිර්මාණය කරන ලද කබුලුමුල්ල දෙවොලේ සහ තුන්කෝරලේ නෑසූ කතා රූපවාහිනී වැඩසටහනේ දී සී. අයි. කේ. බී. රණසිංහ කපුමහතා හා පැවැත්වූ සාකච්ඡාව.
35. සීතාවකපුර යුගය, 49 පිටුව.
36. කබුලුමුල්ලේ පත්තිනි දේවාලය සතුව පවතින මෙනමින් යුත් පද්‍ය එකතුව.
37. H TV ආයතනය විසින් නිර්මාණය කරන ලද කබුලුමුල්ල දෙවොලේ සහ තුන්කෝරලේ නෑසූ කතාරූපවාහිනී වැඩසටහනේ දී ජනශ්‍රැති පර්යේෂක මහානාම දුනුමාල මහතා හා පැවැත්වූ සාකච්ඡාව.
38. සිංහල දේව පුරාණය, 49 පිටුව.
39. ජනශ්‍රැති විද්‍යාව, 150 පිටුව.
40. එම, 171 පිටුව.



## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය:


අමරසිංහ, රිසිමන්, **සීතාවක රාජධානියේ උන්නතියේ ද අවනතියේ ද සමහර අංශ පිළිබඳ විමර්ශනයක්**, මහරගම: තරංජි ප්‍රින්ටර්ස්, 1998.

ආරියවංශ හිමි, වෛරහැර, (සංස්.) **සීතාවකපුර යුගය**, කොළඹ: සමයවර්ධන මුද්‍රණාලය, 1991.

ගමලත්, ඩී. පී., **සීතාවක බැරැන්ඩි කෝවිල**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 1996

ධර්මදාස, කේ. එන්. ඕ. සහ එච්. එම්. එස්. තුන්දෙනිය, **සිංහල දේව පුරාණය**, කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, 1994.

පරණවිතාන, රෝහිණී, (සංස්.) **සීතාවක හටන**, කොළඹ: ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, 1999.

යටවර, එච්. ඩී. එස්. (සංස්.) **දේවාල උපත**, කොළඹ: ආරිය ප්‍රකාශකයෝ, 2005.

රත්නපාල, නන්දසේන, **ජනශ්‍රැති විද්‍යාව**, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2007.

රණවක, නීල්, **සීතාවක රාජසිංහගේ නොනිමි මෙහෙවර**, කොළඹ: සූරිය ප්‍රකාශකයෝ, 2001.

රෝහණදීර, මැන්දිස්, (සංස්.) **අස්ගිරියේ තල්පත**, ගංගොඩවිල: 1969.

ලංකානන්ද හිමි, ලබුගම, (සංස්.) **මන්දාරම්පුර පුවත**, කොළඹ: අනුල මුද්‍රණාලය, 1958.

ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, (සංස්.) **මහාවංශය (සිංහල)**, කොළඹ: 1963.

සූරවීර, ඒ. වී. (සංස්.) **රාජාවලිය**, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1997.

**English**

Geiger, W. (ed.) **Culavamsa**, Colombo: P.T.S, 1923 & 1927.

**Journal of the Royal Asiatic Society, Ceylon Branch, Vol xx, No. 60**, Colombo: 1978.

Perera, S. G. (Trans:) **The Temporal Spiritual Conquest of Ceylon**, (Fernao de Queyroz), Colombo: 1930.

**වෙනත්**

කබුලුමුල්ල රජමහා පත්තිනි දේවාලය සතුව පවතින '**ගනේගොඩ දෙවියන්ගේ කීම**' නමින් යුත් පද්‍ය එකතුව.

H TV ආයතනය විසින් නිර්මාණය කරන ලද '**කබුලුමුල්ල දේවොලේ සහ තුන්කෝරලේ නෑසූ කතා**' රූපවාහිනී වැඩසටහන.

**Kabulumulla Dealaya.com** වෙබ් පිටුව.